සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

Learning Resource Centre R De Mazenod College Kandana 51252

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ................................

සැලකිය යුතුයි.

- පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසට අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ඇති වගන්ති නිවැරදිනම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. පෘථිවි පෘෂ්ඨයෙන් 70% ක් ජලයෙන් වැසී තිබුණ ද, පානීය ජලය ලෙස ප්‍රයෝජනයට ගත හැක්කේ 1%කටත් වඩා අඩු ප්‍රමාණයකි. ( )
2. යහපත් පුරවැසියන් රටට දායාද කිරීම අධ්‍යාපනය මඟින් ඉටු කරන කාර්යභාරයකි. ( )
3. සතුන්ට වඩා ඉක්මනින් මිනිසුන්ට පරිසරයේ වෙනස් වීම් හඳුනාගැනීමේ හැකියාවක් පවතියි. ( )
4. රසායනික ද්‍රව්‍ය අනාරක්ෂිත ලෙස ගබඩා කිරීමෙන් අනතුරු සිදුවිය හැක. ( )
5. ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීම නිසා තම ආයතනයේ කීර්තිනාමයට හානි සිදු වේ. ( )

අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6. ශරීරය වෙව්ලීම, කෑගැසීම, ඇස් විශාල වීම, දිවීම, ගොත ගැසීම ආදී චිත්තවේග ඇතිවන්නේ.
   (1) සතුට නිසාය. (2) දුක නිසාය. (3) කෝපය නිසාය. (4) බිය නිසාය.
7. පොලිස් හදිසි ඇමතුම් සේවා සහ හදිසි මහජන පැමිණිලි සඳහා ඔබට සහාය විය හැකි කෙටි දුරකථන අංකය වන්නේ.
   (1) 118 ය. (2) 119 ය. (3) 110 ය. (4) 911 ය.
8. පරිසරයේ ඇතිවන ස්වභාවික තත්ත්ව වල අන්තගාමී ස්වභාවය නිසා ඇතිවන අයහපත් තත්ත්වයකට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,
   (1) භූ චලන. (2) රිය අනතුරු. (3) අනාරක්ෂිත ඉදිකිරීම්. (4) ඩෙංගු උවදුරු.
9. බහු සංස්කෘතික සමාජයක ජීවත්වන අපි අනුගමනය නොකළ යුතු කාර්යයක් වන්නේ
   (1) අන් සංස්කෘතීන්ට ගරු කිරීම.
   (2) ඔවුන්ගේ අනන්‍යතාවයට හානි නොකිරීම.
   (3) වාර්ගික, ආගමික භේද නොසලකා ජාතියක් ලෙස කටයුතු කිරීම.
   (4) එක් වාර්ගික, ආගමික කණ්ඩායම් දෙස නිතරම සැකයෙන් බැලීම.

10. ඒකාධිපති නායකයෙකු තුළ ඇති ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පොදු දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම. (2) ඉතා දැඩිව ක්‍රියා කිරීම.

(3) ජනතා අදහස්වලට ගරු කිරීම. (4) තමා කැපී පෙනීමට කටයුතු කිරීම.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.
(සාධාරණබව, අභියෝග, ශ්‍රම බලකාය, දුෂ්කර, සාමකාමී, ශ්‍රමාභිමානය, වැටුප, නිර්මාණශීලී)

11. රටක් සංවර්ධනයේ ප්‍රබලම සාධකය .............................................. වේ.
12. අභියෝග ජය ගැනීම සඳහා .............................................. ක්‍රම යොදා ගැනීම වැදගත් වේ.
13. එදිනෙදා කටයුතු වල්දී විවිධ .............................................. වලට අපට මුහුණ දීමට සිදුවේ.
14. නිවසක් තුළ නිදහස් .............................................. පරිසරයක් පැවතීම ඔබේ හැකියා වර්ධනයට උපකාරී වේ.
15. ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභය ..............................................ලෙසින් හැඳින්වේ.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු හිස්තැන තුළ ලියන්න.

16. නිදහස් අධ්‍යාපනය ලංකාවට හඳුන්වා දුන්නේ .............................................. මැතිතුමාය.
17. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් .............................................. පාසල් සිසුන් සඳහා ක්‍රියාත්මක කර ඇත.
18. එක්සත් ජාතීන් ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව වයස අවුරුදු .............................................. සම්පූර්ණ නොකළ පුද්ගලයෝ ළමයින් ලෙස පිළිගැනේ.
19. අධික වර්ෂාපතනය නිසා .............................................. උවදුර ඇති වේ.
20. අතීතයේ ජීවත් වූ අපේ ලක්වාසීන් යුතුකම් ඉටුකිරීමට මනා රුචිකත්වයක් දැක් වූ ජාතියක් බව රොබට් නොක්ස්ගේ .............................................. කෘතියේ සඳහන් වේ.

(ලකුණු 2x20 = ල 40 යි)

## II කොටස

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1. (i) රජය නොමිලේ ඔබට සපයන සේවාවන් දෙකක් ලියන්න.
   (ii) අප රටේ ජනතාව පෞද්ගලික වාහන වෙනුවට භාවිතා කරන පොදු ප්‍රවාහන සේවා දෙකක් සඳහන් කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ මහජන ආරක්ෂාව සඳහා පිහිටුවා ඇති ආරක්ෂක සේවාවන් දෙකක් නම් කරන්න.
   (iv) අපගේ සිත්තුළ ඇතිවන අයහපත් චිත්තවේග තත්ත්වයන් දෙකක් ලියන්න.
   (v) අප රටේ වෙසෙන ජනවර්ග දෙකකට උදාහරණ දෙන්න.
   (vi) වර්තමානයේ අපට නිතර අසන්නට ලැබෙන ස්වභාවික විපත් දෙකක් සඳහන් කරන්න.
   (vii) පාසල් ශිෂ්‍යයෙක් ලෙස ඔබ මුහුණදෙන අභියෝග දෙකක් ලියන්න.
   (viii) ආපදා සහ අනතුරු සම්බන්ධව කටයුතු කරන ආයතන 2 ලියන්න.

(ල. 2x8 = ල 16යි)

2. (i) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාවන් දෙකක් ලියන්න. (ල. 2යි)
   (ii) කිසියම් මුදලක් ගෙවා ලබා ගැනීමට සිදුවන පොදු සේවාවන් හතරක් සඳහන් කරන්න. (ල. 4යි)
   (iii) (a) සමූපකාර ව්‍යාපාර යේ ආදර්ශ පාඨය ලියන්න. (ල. 2යි)
   (b) සමූපකාරය මගින් සපයන සේවාවන් තුනක් නම් කරන්න. (ල. 3යි)

3. (i) විස්තෘත පවුලක ජීවත්වන සාමාජිකයින් වර්ග හතරක් සඳහන් කරන්න. (ල. 2යි)
   (ii) පවුලක විශේෂ කටයුතුවලදී පවුලේ සාමාජිකයින් සාකච්ඡා කර තීරණ ගන්නා අවස්ථා හතරකට උදාහරණ දෙන්න. (ල. 4යි)
   (iii) (a) ළමා අයිතිවාසිකම් ප්‍රධාන තේමා හතරක් යටතේ දක්වා ඇත. ඉන් දෙකක් සඳහන් කරන්න. (ල. 2යි)
   (b) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හතරක් නම් කරන්න. (ල. 3යි)

4. (i) බහු සංස්කෘතික සමාජ පවතින රටවල් දෙකකට උදාහරණ දෙන්න. (ල. 2යි)
   (ii) බහු සංස්කෘතික සමාජයක ජීවත්වීමේ දී අනුගමනය කළ යුතු ගුණාංග හතරක් ලියන්න. (ල. 4යි)
   (iii) ශ්‍රී ලංකාවේ පහත ආගම් වල ප්‍රධාන ආගමික උත්සව එක බැගින් ලියා, ඉන් එක් උත්සවයක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.
   බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි (ල. 5යි)

5. (i) ශ්‍රමය බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න. (ල. 2යි)
   (ii) කායික ශ්‍රමය වැය කරන රැකියා හතරක් සඳහන් කරන්න. (ල. 4යි)
   (iii) හොඳ සේවකයකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියා, ඉන් එකක් සමාජයේ යහපතට හේතුවන ආකාරය විස්තර කරන්න. (ල. 5යි)

6. (i) ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ල. 2යි)

(ii) ආහාර විෂවන අවස්ථා හතරකට උදාහරණ දෙන්න. (ල. 4යි)

(iii) (a) දුම්රිය අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න (ල. 2යි)

(b) මහා මාර්ගයක ගමන් කරන අවස්ථාවකදී රිය අනතුරක් සිදු වුවහොත් ඔබට කළ හැකි කාර්යයන් විස්තර කරන්න. (ල. 3යි)

7 (i) පාසල් සිසුන් ට ගැටළුවකට මුහුණ දීමට සිදුවුවහොත් දක්වන වැරදි ප්‍රතිචාර දෙකක් ලියන්න. (ල. 2යි)

(ii) ගැටළුවක් වඩා යහපත් ලෙස විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ල. 4යි)

(iii) (a) අභියෝගවලට සාර්ථකව මුහුණ දී ජයගත් පුද්ගල චරිත දෙකක් සඳහන් කරන්න. (ල. 2යි)

(b) අභියෝග ජය ගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝසමාජීය නිපුණතා තුනක් ලියන්න. (ල. 3යි)